# වාර්ෂික වාර්තාව - 2019

## සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය

## ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ

## අමාත්‍යාංශය

**2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**ආයතනයේ නම: සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය**

**පටුන**

**පරිච්ඡේද**


**1. සංවිධානය**

1.1 මෙහෙවර

1.2 නීති රාමුව

1.3 සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන්

**2. විශ්ලේෂණය**

**3. ප්‍රගති සමාලෝචනය**

3.1 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධනය - 2018 (වගුව: 1)

3.2 ජයග්‍රහණ

3.2.1 ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම පිළිබඳ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පැවති දැනුවත් කිරීමේ වැඩසටහන්

3.3 අභියෝග

3.3.1 පහළ මට්ටමේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය (ප්‍රා.ලේ.කා.)

**4. වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

4.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

4.2 විගණකාධිපති වාර්තාව

4.3 විගණන වාර්තාවට අනුව කරුණු පැහැදිලි කිරීම

**5. මානව සම්පත් පැතිකඩ (වගුව: 2)**

# 1 වන පරිච්ඡේදය - සංවිධානය

## 1.1 මෙහෙවර

පනතේ අරමුණු සාක්ෂාත් කිරීමට අදාළව සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා සුහසාධන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් පැනනගින අවශ්‍යතා හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම සුහසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ මෙහෙවර විය. මේ අනුව, මෙහෙවර ප්‍රකාශය පහත පරිදි වේ.

"ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී විනිවිදභාවය සහ සමානාත්මතාවය සහතික කරමින් සියලුම ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා සංගත සුහසාධන කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම".

## 1.2 නීති රාමුව

සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය (සු.ප්‍ර.ම.) 2002 අංක 24 දරණ සුහසාධක ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව 2016 ජූලි මස පිහිටුවන ලද අතර එය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 පෙබරවාරි 02 වන දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 1952/22 යටතේ 2016 පෙබරවාරි 15 වන දින නැවත ක්‍රියාත්මක විය. සුහසාධක ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ද විමසා වසර තුනක කාලයක් සඳහා 2016 ජූලි මාසයේදී පත් කරන ලද සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ.

පනතේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ.

- සියලු සුහසාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා නීතිමය රාමුවක් සැකසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා පාරදෘෂ්‍ය ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

## 1.3 සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම;

- පනත මගින් පිරිනමා ඇති හෝ පවරා ඇති බලතල, කර්තව්‍ය සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම.
- මණ්ඩලයට පවරනු ලැබ ඇති ඕනෑම බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම නිලධාරි හෝ රජයේ නිලධාරියෙකු වෙත පැවරීම.

- සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් ලැබීම සඳහා වන නිර්ණායක සකස් කිරීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන නිශ්චය කිරීම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය නිශ්චය කිරීම.
- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- පුද්ගලයන්ට ප්‍රතිලාභ ලැබිය යුතු කාල සීමාව සඳහන් කිරීම.

## 2 වන පරිච්ඡේදය - දළ විශ්ලේෂණය

සුභසාධන ප්‍රතිලාභ පනත (2002) යටතේ පිහිටුවන ලද සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයට (සු.ප්‍ර.ම.), සුභසාධන වැඩසටහන්වලට ප්‍රතිලාභීන් බඳවා ගැනීම, දුක්ගැනවිලි සමනය කිරීම සහ ප්‍රතිලාභ ගෙවීම සඳහා විනිවිද පෙනෙන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා බලය ඇත. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් මූලිකව ප්‍රධාන වැඩසටහන් හතරක් ක්‍රියාත්මක කරනු ලැබේ. සමෘද්ධි දීමනා වැඩසටහන, වැඩිහිටි දීමනාව, ආබාධිත දීමනාව සහ නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා දීමනා වැඩසටහන් යනු එකී වැඩසටහන්ය. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය යනු සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයක් පිහිටුවීම සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ආධාරක ආයතනයයි.

සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ සුභසාධන වැඩසටහන් වල සාධාරණත්වය, කාර්යක්ෂමතාව, විනිවිදභාවය වැඩි දියුණු කිරීමයි. වසර පහක සාර්ථක කාලපරිච්ඡේදයක් සම්පූර්ණ කිරීමෙන් පසු, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතිය (IWMS) ලෙස හැඳින්වෙන පද්ධතියේ වගකීම් දරන ආයතනය වනු ඇත.

මෙම ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතිය ශ්‍රී ලංකා රජයට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. ප්‍රධාන වශයෙන් මේ තුළින් සුභසාධන සැලසීම සම්බන්ධයෙන් වන ඉලක්කගත වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වර්ධනය කළ හැකිය. අප සියලුදෙනා දන්නා පරිදි, විශේෂයෙන් "සමෘද්ධි" වැඩසටනේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාව අතර බෙදා හැරීම සම්බන්ධයෙන් විශාල වශයෙන් අභ්‍යන්තර හා බාහිර දෝෂ තිබේ. මෙම ක්‍රමය තුළින් රටේ අඩු ආදායම්ලාභී ප්‍රජාවන්ගේ සහ හුදෙකලා කලාපවල හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා සුභසාධන වැඩසටහන් වඩාත් විනිවිදභාවයක් හා වගවීමකින් යුතු වැඩසටහන් බවට පත් කළ හැකි අතර, දෝෂ අවම කිරීම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ජාතික මට්ටමේ වැඩසටහන් හරහා සුදුසු තේරීම් නිර්ණායක හඳුන්වා දීමෙන් ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී නිවැරදි ක්‍රියාවලිය අනුගමනය කිරීම ප්‍රවර්ධනය කළ හැකිය.

මෙයට අමතරව මෙම ක්‍රමය හරහා සමාජ සුභසාධන සේවාවන්හි ප්‍රවේශ්‍යතාවය සහ ප්‍රතිචාරාත්මක බව වැඩි දියුණු කිරීම, රජයට දැරීමට වන ගනුදෙනු පිරිවැය අඩු කිරීම සහ සැලකිය යුතු මුදලක් ආයෝජනය කිරීම සඳහා නැවත යොමුකිරීම සිදුවේ. එසේම, මෙම උපයන මුදල් රටේ වෙනත් ප්‍රදේශයක් සඳහා භාවිතා කළ හැකිය. ඒ හැරුණු විට, ඒකාබද්ධ සමාජ සුභසාධන කළමනාකරණ වැඩසටහන් සඳහා වෙන් කර ඇති සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සහතික කිරීම සහ අධීක්ෂණ හා ඇගයීම් කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය සහ මානව හැකියාවන් වැඩිදියුණු කළ හැකිය

# 3 වන පරිච්ඡේදය - ප්‍රගති සමාලෝචනය

## 3.1 ක්‍රියාකාරී සැලැස්ම -2019 මත පදනම් වූ කාර්ය සාධනය

මෙම වගුවේ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව 2019 වර්ෂය තුළ සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි. ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලය විසින් සකස් කර අනුමත කරන ලද අතර ක්‍රියාත්මක කිරීම විශාල වශයෙන් සාර්ථක වූ නමුත් 2019 සඳහා වන ක්‍රියාකාරී සැලැස්මයි ක්‍රියාවට නැංවීමේ දී පහත දැක්වෙන අභියෝගවලට මුහුණදීමට සිදුවුණි.

| අංක | ප්‍රධාන ක්‍රියාකාරකම් | කාලය / ඉලක්කය | ප්‍රගතිය / විශේෂ සටහන් |
|---|---|---|---|
| 1 | පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ (සු.ප්‍ර.ම.) ධාරිතාවය ශක්තිමත් කිරීම. | නව බඳවා ගැනීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම. | එක් අතිරේක කොමසාරිස්වරයකු සහ සහකාර කොමසාරිස්වරයෙකු ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගැනීම. අතිරේක කොමසාරිස්වරයෙකු පත් කර ඇති නමුත් එම පත්වීම සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති විසින් කල් දමා ඇත. |
| | | මාර්තු 2019 තනතුරු පිළිබඳ ප්‍රචාරණය කිරීම. | |
| | | 2019 මැයි සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම සමඟ සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධති මෙහෙයුම් ප්‍රාදේශීය ලේකම් කොට්ටාශ මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා සේවයට බඳවා ගැනීම් හඳුනා ගැනීම. | තෝරාගත් සමහර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ අනෙකුත් බලධාරීන්ගේ සහාය ඇතිව කරන ලද මූලික සාකච්ඡාවලදී ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් සුභසාධන ප්‍රතිලාභ තොරතුරු ඒකක (WBIU) පිහිටුවීමට මූලිකව එකඟ විය. |

| | | | |
|---|---|---|---|
| | | ජුනි 2019<br>අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගැනීම. | |
| | | අගෝස්තු 2019<br>බඳවා ගැනීම් ආරම්භ කර සම්පූර්ණ කිරීම. | |
| 2 | සමාජ ආරක්ෂණ සහ ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම. | සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ ආරක්ෂණ ඒකකයේ කාර්යමණ්ඩලය පුහුණු කිරීම. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය, ජා.ඉ.ආයතනය සහ KPMG ආයතනයේ සහයෝගයෙන් යුතුව සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතියෙහි අවශ්‍යතා අනුව සිදුකරන ලද වෙනස් කිරීම් වලට අනුකූලව නිසි පුහුණුවක් ලබා දෙන ලදී. |
| | | 2019 - ජුනි-අගෝස්තු<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක.තො.ප. පිළිබඳ කාර්යමණ්ඩලය පුහුණු කිරීම (දෙවන වටය). | |
| | | 2018 සැප්තැම්බර්<br>දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලතල පැවරීම. | හඳුනාගෙන ඇති රෙගුලාසි සමාලෝචනය කරමින් බලතල පැවරීමේ හා කමිටු පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන සංශෝධනයක් සිදුකළ යුතු අතර සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයෙහි රෙගුලාසි සංශෝධනය කිරීමේදී මේ පිළිබඳ අවධානය යොමුකරනු ඇත. |
| | | ඔක්. 2019<br>තේරීම් කමිටු හා අභියාචනා කමිටු පිහිටුවීම | |
| | | 2019 නොවැ. - දෙසැම්බර්<br>කමිටු සහ අභියාචනා කමිටුවල සාමාජිකයින් සඳහා පුහුණුව ලබාදීම. | |
| 3 | ආපදා ප්‍රතිපාදන ප්‍රතිසාධන සැලැස්මක් සකස් කිරීමට සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිට සහාය වීම. | 2019 පෙබරවාරි<br>සු.ප්‍ර.මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා පෙරහුරුවක් ලබා දීම. | උපදේශක සමාගම ආපදා ප්‍රතිසාධන සැලැස්මේ අවසන් වාර්තාව අවසන් කළ අතර, ඊට අමතරව උපදේශන සමාගම විසින් සු.ප්‍ර.මන්ඩලයේ කාර්ය මණ්ඩලය සහ |

| | | | |
|---|---|---|---|
| | | මාර්තු 2019<br>පෙරහුරුව සඳහා තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලයක් සම්බන්ධකර ගැනීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් සඳහා පෙරහුරු වැඩමුළු පවත්වන ලදී. |
| | | අප්‍රේල් 2019<br>උපදේශක ආයතනයේ අවසාන කෙටුම්පත සමාලෝචනය කිරීම. | |
| | | 2019 දෙසැම්බර්<br>ආපදා ප්‍රතිසාධන සැලැස්ම / ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම ක්‍රියාත්මක කිරීම. | |
| 4 | සමෘද්ධි ලාභීන්, වැඩිහිටියන්, ආබාධිත පුද්ගලයින් සහ නිදන්ගත වකුගඩු රෝගීන් සඳහා සුභසාධන ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රම සකස් කිරීම. | 2019 පෙබරවාරි<br>අමාත්‍යමණ්ඩල සංදේශය අනුමත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයට නැවත ඉදිරිපත් කිරීම. | |
| | | මාර්තු 2018<br>සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම. | මාර්ගෝපදේශ විසි දෙක මත පදනම්ව, සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමවලට අදාළව 2019.06.02 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී. |
| | | 2019 අප්‍රේල් -ජුනි<br>යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම. | |
| | | 2019 ජුලි<br>ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කිරීම. | |
| 5 | රෙගුලාසි කෙටුම්පත සකස් කිරීම. | 2019 ජනවාරි<br>අමාත්‍ය මණ්ඩල සංදේශය නැවත ඉදිරිපත් කිරීම. | |
| | | 2019 පෙබරවාරි<br>කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම. | |

| | | | |
|---|---|---|---|
| | | මාර්තු 2019<br>කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීම. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ සහාය ඇතිව සු.ප්‍ර.මණ්ඩලය විසින් රෙගුලාසි කෙටුම්පත් කර නීති කෙටුම්පත් කාර්යාලයට ඉදිරිපත් කරන ලදී. |
| | | 2019 මැයි<br>කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. | |
| | | ජුනි 2019<br>අනුමත රෙගුලාසි ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරීම. | |
| | | 2019 ජුලි<br>පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. | |
| 6 | සු.ප්‍ර.මණ්ඩලයේ වැඩ පිළිබඳ තොරතුරු සඳහා මහජනතාවට ප්‍රවේශයවීමට අවකාශ සැලසීම. | 2019-අප්‍රේල්<br>වෙබ් අඩවිය සහ සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය දියත් කිරීම. | සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සමාජ ආරක්ෂණ ඒකකයේ කණ්ඩායම සු.ප්‍ර.මණ්ඩලයේ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා වෙබ් අඩවිය සකස් කර ඇත. සු.ප්‍ර.මණ්ඩලයේ මූලික සැලැස්ම වූයේ සු.ප්‍ර.මණ්ඩලයේ වෙබ් අඩවිය සහ සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය යන දෙකම එකට දියත්කිරීමයි. පද්ධතියේ පැවති ගැටළු හේතුවෙන් පද්ධතිය පිළිගැනීමට සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය/ සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය එකඟ නොවීය. එබැවින් පද්ධතියෙන් එය ඉවත් නොවීය. |

| | | | |
|---|---|---|---|
| 7 | සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යාලය කම්කරු ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම. | | |

*වගුව 1: ප්‍රගති සමාලෝචනය*

### 3.2 ජයග්‍රහණ

3.2.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ෂෝශල් රෙජිස්ට්‍රි තොරතුරු පද්ධතියේ තිරසාරභාවය මත පදනම්ව, දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්යාල ආවරණය වන පරිදි ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සකස් කිරීම අවශ්‍ය වේ. මෙම කර්තව්‍යය ඉටු කිරීම සඳහා සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය (WBB) සහ සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) උපදේශන සමාගමේ සහාය ඇතිව දිස්ත්‍රික් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

### 3.3 අභියෝග

3.3.1 පහළ මට්ටමේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය (ප්‍රා.ලේ.කා.)

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන අතරතුර, පරිගණක / තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවයේ මට්ටම අප නිරීක්ෂණය කළ අතර, සහභාගී වූ බොහෝ නිලධාරීන්ට තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිබව නිරීක්ෂණය වුණි. එබැවින්, පද්ධතිය සහ මාර්ගගත මෙහෙයුම් පිළිබඳ පැහැදිලි අදහසක් ලබා ගැනීමට අපට අමතර වෑයමක් දැරීමට සිදු විය.

# 4 වන පරිච්ඡේදය - 2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා

## සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 4.1 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශ

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සන්සන්දනාත්මක ආදායම් ප්‍රකාශය**

| විස්තරය | සටහන | 2018 | 2017 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රජයේ ප්‍රදාන | **1** | 7,967,266 | 8,703,637 |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | **2** | 7,093,495 | 7,572,743 |
| වෙනත් මෙහෙයුම් වියදම් | **3** | 940,456 | 1,484,089 |
| | | 8,033,951 | 9,056,832 |
| **වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)** | | **- 66,685.10** | **-353,195.07** |

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

| | | 2019 | 2018 |
|---|---|---|---|
| | සටහන | රු. | රු. |
| **සංයුතිය 01** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 4 | 4,002,774.73 | 4,259,199.33 |
| **ජංගම වත්කම්** | | | |
| ලැබිය යුතු | 5 | 50,000.00 | 50,000.00 |
| | | **4,052,774.73** | **4,309,199.33** |
| **මූල්‍යයනය** | | | |
| ශුද්ධ වත්කම්/සම කොටස් | | | |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 4,584,793.00 | 4,584,793.00 |
| සමුච්චිත අතිරික්තය / (හිඟය) | | 540,222.25 | - 425,585.15 |
| මුළු ශුද්ධ වත්කම් /සම කොටස් | | 4,044,570.75 | 4,159,207.85 |
| **ජංගම වගකීම්** | | | 7,967,265.92 |
| උපචිත වියදම් | 6 | 8,203.98 | 149,991.48 |
| | | **4,052,774.73** | **4,309,199.33** |

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | **දේපළ, පිරියත හා උපකරණ වෙන් කිරීම්** | **සමුච්චිත අතිරික්තය / (හිඟය)** | **එකතුව** |
|---|---|---|---|
| 01/01/2017 දිනට ශේෂය | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ වෙන් කිරීම් | 3,773,670.00 | | 3,773,670.00 |
| වර්ෂය සඳහා දේපළ, පිරියත හා උපකරණ වෙන් කිරීම් | 811,123.00 | | |
| වර්ෂයේ අතිරික්තය / (හිඟය) | - | (72,390.08) | (72,390.08) |
| 31/12/2017 දිනට ශේෂය | **4,584,793.00** | **(72,390.08)** | **3,701,279.92** |
| | | | |
| | **දේපළ, පිරියත හා උපකරණ වෙන් කිරීම්** | **සමුච්චිත අතිරික්තය / (හිඟය)** | **එකතුව** |
| | | | - |
| 01/01/2018 දිනට ශේෂය | 4,584,793.00 | (72,390.08) | 4,512,402.92 |
| වර්ෂය සඳහා දේපළ, පිරියත හා උපකරණ වෙන් කිරීම් | - | | |
| වර්ෂයේ අතිරික්තය / (හිඟය) | - | (353,195.07) | (353,195.07) |
| 31/12/2018 දිනට ශේෂය | **4,584,793.00** | **(425,585.15)** | **4,159,207.85** |
| | | | |
| | | | |
| | **දේපළ, පිරියත හා උපකරණ වෙන් කිරීම්** | **සමුච්චිත අතිරික්තය / (හිඟය)** | **එකතුව** |
| 01/01/2019 දිනට ශේෂය | 4,584,793.00 | (425,585.15) | 4,159,207.85 |
| විගණන ගාස්තු - 2018 | | (47,952.00) | (47,952.00) |
| වර්ෂයේ අතිරික්තය / (හිඟය) | - | (66,685.10) | (66,685.10) |
| 31/12/2019 දිනට ශේෂය | **4,584,793.00** | **(540,222.25)** | **4,044,570.75** |
| | | | |

**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2019 |
|---|---|
| | රු. ශත |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | (66,685.10) |
| වැඩිවන මෙහෙයුම් පිරිවැය | - |
| ගැලපුම් සඳහා: | |
| ක්ෂය වෙන් කිරීම් | 256,424.60 |
| **කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය** | **189,739.50** |
| පෙර වර්ෂයේ ගැලපීම් | (47,952.00) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දැහි (අඩුවීම) / වැඩිවීම | (141,787.50) |
| ලැබිය යුතු දැහි (අඩුවීම) / වැඩිවීම | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උපයන ලද ශුද්ධ මුදල් | **-** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | - |
| ශුද්ධ මුදල් (භාවිතා කළ) ආයෝජන ක්‍රියාකාරකම් | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | |
| කල්බදු ගෙවීම | - |
| මූල්‍යයමය ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් භාවිතය | **-** |
| | |
| වර්ෂය තුළ මුදල් හා මුදල් සමානකම්වල ශුද්ධ වැඩිවීම | - |
| වසරේ ආරම්භයේ දී මුදල් හා මුදල් සමානතා | - |
| **වසරේ අවසානයේ දී මුදල් හා මුදල් සමානතා** | **-** |
| | |

**වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමානකම් විශ්ලේෂණය කිරීම**

ඇමුණුම් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

### 01. පොදු කරුණු

1.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1952/22 අති විශේෂ ගැසට් නිවේදනය යටතේ 2016 පෙබරවාරි 15 වන දින යළිත් ක්‍රියාත්මක වන 2002 අංක 24 සුභසාධන ප්‍රතිලාභ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය 2016 ජූලි මාසයේදී ස්ථාපිත කරන ලදී.

1.2 සුභසාධන ප්‍රතිලාභ පනතේ 2 වන වගන්තියට අනුව ව්‍යවස්ථාදායක සභාව සමඟ සාකච්ඡා කර මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් වසර තුනක කාලයක් සඳහා 2016 ජූලි මාසයේදී පත් කරන ලද සභාපති සහ සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ.

1.3 සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය මහලේකම් කාර්යාලය, කොළඹ 01 හි මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ 1 වන මහලේ පිහිටා ඇත.

1.4 සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අරමුණු

- ප්‍රධාන අරමුණ, සියලු සුභසාධන ප්‍රතිලාභ ගෙවීම සඳහා කාර්යරාමුවක් සැලසීම.
- ප්‍රතිලාභ ලබන්නන් හඳුනා ගැනීම සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් සැකසීම.
- එවැනි ප්‍රතිලාභ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

සුභසාධන ප්‍රතිලාභ පනත මගින් ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම පිණිස සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලයට බලය ලබා දී ඇත.

- පනත මගින් ලබා දී ඇති හෝ පවරා ඇති බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ සිදු කිරීම.
- මණ්ඩලයට පවරා ඇති බලතල දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හෝ ග්‍රාම නිලදාරි හෝ රජයේ නිලධාරියෙකුට පැවරීම.
- සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රම ස්ථාපිත කිරීම.
- සුදුසුකම් සඳහා වන නිර්ණායක සැකසීම.
- යෝජනා ක්‍රමයක් අනුව මූල්‍ය ප්‍රතිපාදන සඳහන් ක්රීම.
- යෝජනා ක්‍රමය ආරම්භ කරන දිනය නිශ්චය කිරීම.

- ප්‍රදානය කළ යුතු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභ නිශ්චය කිරීම.
- ප්‍රතිලාභ ලැබීමට පුද්ගලයන්ට හිමිකම් ඇති කාල සීමාව සඳහන් කිරීම.

1.5. මූල්‍ය ප්‍රකාශනය

සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය ප්‍රකාශන මෙමගින් ඉදිරිපත් කරයි.

## 02. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තීර්ණ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වියදම් ප්‍රකාශය, එහි ජංගම නොවන වත්කම් ලැයිස්තුව, මූල්‍ය ප්‍රකාශය පිළිබඳ සටහන් ලැයිස්තුයෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.1 මූල්‍ය හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ.

2.2 අඛණ්ඩ පැවැත්ම

සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් සැලසුම් කරන ලද පහත දක්වා ඇති ප්‍රතිපත්ති, සුහසාධන ප්‍රතිලාභ සඳහා සුදුසු ක්‍රමවේදයක් වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනයන්ට අදාළ වේ.

2.3 පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදාගෙන ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති වසර තුනක කාල සීමාවන්ට එය අඛණ්ඩව අදාළ කර ගැනීමට සුහසාධක ප්‍රතිලාභ මණ්ඩලය අපේක්ෂා කරයි.

- **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

සියලුම කාර්යාල උපකරණ ආරම්භයේදී පිරිවැයට වාර්තා කරනු ලබයි. උපකරණවල පිරිවැය යනු මිලදී ගැනීමේදී වැට් බද්ද සමඟ අත්පත් කර ගැනීමේ දී දරනලද පිරිවැයයි.

- **විස්තීර්ණ ආදායම් ප්‍රකාශ**

(අ) ආදායම් හඳුනා ගැනීම

ආදායමක් ලෙස සැලකෙන රජයෙන් ලැබෙන අග්‍රිම

(ආ) වියදම් හඳුනා ගැනීම

වියදම් ප්‍රකාශයේදී වියදම්, සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පරිපාලන හා සාමාන්‍ය වියදම්, සුභසාධන ප්‍රතිලාභ වියදම් හා සන්නිවේදන වියදම් ලෙස හඳුනාගනී. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා වන සියළුම වියදම් වියදම් ප්‍රකාශයට ගෙන ඇත.

(ඇ) ක්ෂයවීම

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් පවරන ලද වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන වෙන්කර නොමැත. සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් මිලදී ගෙන ඇති වත්කම් පමණක් ක්ෂයවීම ගණනය කරන ලදි.

වත්කම්වල ඇස්තමේන්තුගත ආයුකාලය අනුව සරල මාර්ග පදනම මත පහත දැක්වෙන පරිදි ක්ෂය ගණනය කරනු ලැබේ.

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 20% |
| යන්ත්‍රෝපකරණ | 33.33% |

(ඈ) බදුකරණය

උපයනවිට ගෙවීම් බද්ද දේශීය ආදායම් පනතේ 01 වගුව මත පදනම් වේ.

**4.2 විගණකාධිපති වාර්තාව**

**<u>සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය 7 ප්‍රකාරව, මණ්ඩලයේ සමස්ත දේපල, පිරියත සහ උපකරණවලින් සියයට අනූ දෙකක ප්‍රමාණයක් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂයකර නොමැත.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය

සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

**3. වෙනත් විගණන නිරීක්ෂණ**

(අ) කාර්ය සාධනය

සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය (SRIS) සහ ඒකාබද්ධ සුබසාධන කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම , සමාජ ආරක්ෂණ තොරතුරු පද්ධතිය සඳහා ආපදා ප්‍රතිසාධන සැලැස්ම පිළියෙල කිරීම, සුභසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළියෙල කිරීම, සුභසාධන ප්‍රතිලාභ පනත සඳහා රෙගුලාසි කෙටුම්පත් කිරීම සහ සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය සඳහා වන වෙබ් අඩවියක් ස්ථාපිත කිරීම වැනි වැඩසටහන් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එම ඉලක්කයන් සමාලෝචිත වර්ෂය තුළ සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 වන විට තථ්‍ය සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාව වූ 18 න් 08 ක් පමණක් විය. ඒඅනුව සභාපති තනතුර ද ඇතුළුව තනතුරු 10 ක් පුරප්පාඩු විය. එසේම, සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් තාවකාලික පදනමින් බඳවාගෙන ඇත. මණ්ඩලය 2016 දී පිහිටුවන ලද නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිසි බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියක් සකස් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. මේ අනුව, ඉහත තත්ත්වය මණ්ඩලයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපා ඇති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

(ඇ) සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා මණ්ඩලයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 15 ක් සහ රුපියල් මිලියන 2 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පුනරාවර්තන වියදම් වලින් 52% ක් පමණක් භාවිතා කර ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න<br>
විගණකාධිපති

## 4.3 විගණන වාර්තාවට අනුව කරුණු පැහැදිලි කිරීම

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
Welfare Benefits Board

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය<br>කොළඹ 01 | நிதி அமைச்சு,<br>கொழும்பு 01, இலங்கை | The Ministry of Finance,<br>Colombo 01.Sri Lanka |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | WBB/ACCT/Au/Quarry/2020 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 09 .07. 2020 |

විගණන අධිකාරී

සහකාර විගණකාධිපති කාර්යාලය,

මහා භාණ්ඩාගාරය.

කොළඹ - 01.

<u>මූල්‍ය ප්‍රකාශන විගණනය - 2019</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක TRE/B/WBB/19/23 හා 2020.06.24 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපිය හා බැදේ.

02. 2018 වර්ෂයේ ලැබිය යුතු අත්තිකාරම් රු.50,000/= මුදල සම්බන්දයෙන් අදාල ආයතනයට සිහි කැදවීමක් දැනටමත් යොමු කර ඇත.

03. <u>අරමුදල් ඌන උපයෝජනය</u>

ඒකාබද්ධ සුභසාධක කළමනාකරණ පද්ධතිය ( IWMS) සකස් කිරීම් කටයුතු අවසන් අදියරේ පැවතීමෙන් හා එය දියත් කළ පසු බඳවා ගැනීමට අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සිදු නොවීම නිසා ඒ වෙනුවෙන් වෙන් කරන ලද පුනරාවර්තන වියදම් උපයෝජනය කර නොමැත. එමෙන්ම අප කාර්යාලය නාරාහේන්පිට මෙහෙවර පියස ගොඩනැගිල්ලට ගෙනයාමට සැළසුම් කළ තිබුන ද , එය අපේක්ෂිත පරිදි සිදු නොවීම නිසා නව කාර්යාලීය උපකරණ මිල දී ගැනීම සිදුනොවිය. එහෙයින් වෙන් කරන ද ප්‍රතිපාදන අපේක්ෂිත පරිදි උපයෝජනය කළ නොහැකි බව අදාල විගණන නිරීක්ෂණ සඳහා දන්වමි.

අතිරේක කොමසාරිස් (වැ.බ.)

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය

මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය,

කොළඹ - 01.

Chairman/Commissioner: E-mail: welfarebenefitboard2016@gmail.com info@iwms.wbb.gov.lk කාර්යාලය அலுவலகம் Office Tele- 011- 2151481 (ext-4117) Fax - 011- 2151482 (ext-4182)

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
Welfare Benefits Board

මුදල් අමාත්‍යාංශය
කොළඹ 01

நிதி அமைச்சு,
கொழும்பு 01, இலங்கை

The Ministry of Finance,
Colombo 01.Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | WBB/ACCT/Au/Quarry/2020 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | .07. 2020 |

විගණන අධිකාරී

සහකාර විගණකාධිපති කාර්යාලය,

මහා භාණ්ඩාගාරය.

කොළඹ - 01.

**<u>මූල්‍ය ප්‍රකාශන විගණනය - 2019</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක TRE/B/WBB/19/23 හා 2020.06.24 දිනැතිව මා වෙත යොමු කරන ලද ලිපිය හා බැදේ.

02. මෙ සම්බන්ධයෙන් 2020.07.09 දින යොමු කරන ලද ලිපියට අමතර වශයෙනි.

**<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

(අ) සමාලෝචිත වර්ෂයේ වර්ෂයේ ආරම්භක ශේෂ ජර්නල් සටහන් 2020 වර්ෂයේදි සිට අදාල කටයුතු කරනු ලැබේ.

ඩබ්ලිව්.එච් අනුෂ්කාවිමලජීව.

ගණකාධිකාරී -වැ.බ.

සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය.

මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය.

Chairman/Commissioner:

E-mail: welfarebenefitboard2016@gmail.com
info@iwms.wbb.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office

Tele- 011- 2151481 (ext-4117)
Fax - 011- 2151482 (ext-4182)

## 5 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

| රැකියා බාණ්ඩය | තනතුර | අනුමත පුරප්පාඩු සංඛ්‍යාව | පවතින පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු හිඟය | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | සභාපති / කොමසාරිස් | 1 | 1 | - | - |
| HM 1-1 | අතිරේක කොමසාරිස් | 1 | 1 | - | - |
| MM 1-1 | නියෝජ්‍ය කොමසාරිස් | 1 | 0 | - | - |
| MM 1-1 | සහකාර කොමසාරිස් | 1 | 0 | 1 | - |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (වැඩබලන) | 0 | 1 | | |
| HM 1-3 | ගණකාධිකාරී | 1 | 1 (වැඩබලන) | - | - |
| MA - 3 | සංවර්ධන නිලධාරී | 1 | 1 | - | - |
| MA 1-2 | කළමනාකරණ සහකාර | 2 | 1 | 1 | - |
| PL-1 | කාර්යාල සහයක | 2 | 2 | - | - |
| PL-3 | රියදුරු | 2 | 1 | 1 | - |
| | මෘදුකාංග සංවර්ධක | 1 | 1 | - | - |
| | පද්ධති පරිපාලක | 1 | 1 | - | - |
| | තොරතුරු තාක්ෂණ විධායක | 2 | 1 | 1 | - |
| | හෙල්ප් ඩෙස්ක් ක්‍රියාකරු | 3 | 0 | 3 | - |

*වගුව 2 : මානව සම්පත් පැතිකඩ*